292

RARE

# අපරාධ සම්භවය සහ නිවාරණ මාධ්‍යයන් පිළිබඳ බෞද්ධ මතය

-අපරාධවිද්‍යාව පිළිබඳ විචාරාත්මක බෞද්ධ ප්‍රවේශයක්-

# *The Buddhist view of the Origin of Crimes and the Means of Eradicating them*

**- A Critical Buddhist Approach to Criminology -**


| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 292 |
| වර්ග අංකය | |


**පරාක්‍රම ශ්‍රී වික්‍රමරත්න**

ශාස්ත්‍රවේදී (පේරාදෙණිය),ශ්‍රම විද්‍යාවේදී (විශේෂ) (කොළඹ), නීතිවේදී (ශ්‍රී ලංකා).
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (ශ්‍රී ලංකා),
පශ්චාත් උපාධි අධිකරණ වෛද්‍ය විද්‍යා ඩිප්ලෝමා (වෛද්‍ය පීඨය - කොළඹ),
ආයුර්වේද ශාස්ත්‍රී ඩිප්ලෝමා (ශ්‍රී ලංකා). ඉංග්‍රීසි ඩිප්ලෝමා (කැලණිය),
ශාස්ත්‍රපති - බෞද්ධ දර්ශනය (කැලණිය),
දර්ශනපති - දර්ශනය (පේරාදෙණිය),

**ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ , දිවුරුම් කොමසාරිස්, ප්‍රසිද්ධ නොතාරිස් සහ සමාගම් ලේකම්**

(ලියාපදිංචි අංකය : මාශාපි/දප/බෞද/96/16)

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ බෞද්ධ අධ්‍යයන දර්ශනපති උපාධි පරීක්ෂණයට ආදාළව
ඉදිරිපත් කරන ලද පර්යේෂණ නිබන්ධයයි.

කැලණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

2001 ජූලි

# 1. නිබන්ධ සාරාංශය

## (i). පර්යේෂණ ගැටළුව (Research Problem)

අපරාධ පිළිබඳ බෞද්ධ ප්‍රවේශය ඉතා පුළුල් අධ්‍යයන ක්ෂේත්‍රයකි. මෙම පර්යේෂණ ගැටලුව වන්නේ අපරාධ ප්‍රභවය වීමට බලපාන මූලික හේතු ගවේෂණය කිරීමයි. ශ්‍රී ලංකාවේ අපරාධ වැඩිවීමට මූලික හේතු සාධකයන් වන්නේ මනෝවිද්‍යාත්මක සාධක ද නැතහොත් පරිසරාත්මක (ආර්ථික, සමාජ, සංස්කෘතික යනාදි) සාධක ද යන්න විමර්ශනය කළ යුතු වේ.

ශ්‍රී ලංකාවේ මෑත භාගයේ වන තෙක් පරම්පරා දෙක තුනක් එකට එක් වහලක් යට එක් ආධිපත්‍යයක් යටතේ වාසයෙන් හා සංවාසයෙන් ජීවත් වූ විස්තෘත පවුල් රටාව (Ectended Family System) දක්නට විය. නමුත් නූතනයේ කැපී පෙනෙන පවුල් ක්‍රමය ඊට හාත්පසින්ම වෙනස් වූ පියා-මව-දරුවා එකට ජීවත් වන න්‍යෂ්ටික පවුලයි. විස්තෘත පවුල් ක්‍රමයක් තුළ පැවති සමාජ සම්බන්ධතා අතර හිතකර ප්‍රතිඵලයක් විය. එය වූ කලී එකිනෙක සාමාජිකයන් අතර පැවති අන්තර් පුද්ගල සමාජ ආරක්ෂණයයි. ඒ අයුරින් මෙම පවුල් රටාවෙහි ව්‍යුහය, දෙමාපිය සබඳතා, ඥාති සබඳතා, පවුල තුළ සමාජිකයන්ට හිමිවන තැන හා වගකීම සහ දෙමාපිය දූ දරු සබඳතාව යන බහුවිධි සාධක රාශියක් වෙතින් පුද්ගල චර්යා රටා හැඩගැස්වීම කෙරෙහි බලපායි. එපමණක් ද නොව පුද්ගල සමාජානුයෝජන ක්‍රියාවලියේ ස්වරූපය ද පුද්ගල චර්යා රටාවන් හැඩගැස්වීම කෙරෙහි බලපායි. මිනිසා උපතේ සිට ඒ තුළ හැදෙන වැඩෙන බැවින් "පවුල" (Family) නැමැති සාධකය පුද්ගල චර්යා රටාවන් හැඩගැස්වීමෙහි ලා ඉතා ප්‍රබල කේන්ද්‍රස්ථානයක් වන්නේ ය.

ශ්‍රී ලංකාවේ අපරාධ වාර්ෂිකව වැඩිවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කෙරෙයි. අපරාධ වර්ධනය වීම ජනගහනයේ වර්ධනයට වෙනස් ආකාරයකට ගමන් කරයි. මේ අයුරින් නොසලකා සිටිය නොහැකි තත්ත්වයකින් වර්ධනය වෙමින් පවතින ශ්‍රී ලංකාවේ අපාරාධ වලට මූලික වන හදිසි කෝපය, කල්පවත්නා අමනාපකම් වැනි අවශේෂ සාධක හේතුවන බව පසුගිය කාලවලදි පොලිස්පතිවරයා විසින් නිකුත් කොට ඇති පාලන වාර්තා විමසීමේදි

පෙනී යයි. අපරාධවලට මිනිසා යොමුවන්නේ එහි ක්‍රියාවන් කෙරෙහි දරුණු මානසික තත්ත්වයක් පැවතීම තුළිනි. එම දරුණු සිත් සන්සුන් කරනු වස් හඳුන්වා දිය හැකි සංවිධාන හා ආයතන කීපයක් මෙසේ පෙළගැස්විය හැකි ය.

අපරාධ වැඩිවෙමින් පවතින ගම්බද ප්‍රදේශවල ග්‍රාම සංවර්ධනය සඳහා සමිති හා ප්‍රජා මණ්ඩල පිහිටුවා ඒවා වැඩි දියුණු කළ හැකිය. සමස්තයක් වශයෙන් ක්‍රීඩා සමිති, ස්වෙච්ඡා සංවිධාන වැඩියෙන් ආරම්භ කිරීම, පාසල් හා දහම් පාසල් වැඩි දියුණු කිරීම, විහාරස්ථාන, දේවස්ථාන වැනි ආගමික මධ්‍යස්ථානවලට පොදු ජනතාව වඩ වඩාත් යොමු කරවා ගැනීම තුළින් ද අපරාධ ක්‍රියා වලට මිනිසා ගොදුරු වීම වළක්වා ගැනීමට පුළුවන. බෞද්ධ අධ්‍යයනය තුළින් කළ හැකි කාර්ය භාරය අපමණය. අතිවිශාලය. මිනිසාගේ යහපත් ගුණධර්ම වගාවට. සාරධර්ම වර්ධනයට විහාරස්ථාන, දයම්පාසල් වැනි ආයතන මගින් ලබාදිය හැකි අනුබලය වෙසෙසින් වැදගත් වේ.

තත්ත්වය එසේ වුවද, චරිත ශෝධන-සමාජ ශෝධන ආයතන හා සංවිධාන, ස්වෙච්ඡා සංවිධාන, සාක්ෂර ඥානය වැඩි දියුණු කරනු වස් පාසල් රට පුරා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙද්දි, මහජන සාමය ආරක්ෂා කරනු වස් පොලිස් සේවය පුළුල්ව නවීකරණය කරද්දි. බහු ආගමික ආයතන හා සංවිධානවලින් ඵල-විපාක පෙන්වද්දීත්, මෙලොව වශයෙන් ලැබෙන දඬුවම් ගැන කථා කරද්දි. මේ කිසිවක් අල්පයකටවත් නොතකා අපරාධවල අධිවර්ධනයක් දෘශ්‍යමාන වේ; වාර්තා වේ. එසේ නම් මේ ප්‍රශ්නයට සැබෑ හේතුව කුමක් වන්නේද? ශ්‍රී ලංකාවේ මෑතකදී කරන ලද සමීක්ෂණයකට අනුව. සෑම විනාඩි දහයකට වරක්ම අපරාධයක් වන බව හෙළි වී ඇත. මහා පරිමාණ සොරකම්, ස්ත්‍රී දූෂණ , මනුෂ්‍ය ඝාතන හා ළමා අපහරණ ඊට ඇතුළත් වේ.

## (2) පර්යේෂණ ක්‍රමවේදය (Research Methodology)

අපරාධ පිළිබඳ විවිධ සමාජ විද්‍යාඥයින් විවිධ කාලවල මත රාශියක් ඉදිරිපත් කර ඇත. අපරාධවිද්‍යාව (Criminology) තුළ හෝ අපරාධ නීතිය (Criminal Law) තුළ තවමත් නිශ්චිත එකඟතාවයකට නොපැමිණි මෙම මත වාදයන් උද්ධරණය කරගෙන ශ්‍රී ලංකාවේ අපරාධවල මූලයන් තේරුම් ගැනීම උකහට කරුණක් වී තිබේ. එබැවින් බුදුසමයේ එන

ඉගැන්වීම්වලට අවධානය යොමු කරමින් අපරාධවල ප්‍රභවයට හේතු සහ නිවාරණ මාධ්‍යයන් අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ පරමාර්ථයයි.

මෙම පර්යේෂණ නිබන්ධය සඳහා තොරතුරු හා දත්ත රැස්කර ගැනීමේදී ඊට ආදාළ වන විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ගොස් ලිපි ලේඛනද ඇතැම් දෙපාර්තුමේන්තු පාලන වාර්තාවන්ද පරිශීලනය කරන ලදී. මෙම පර්යේෂණය සඳහා අනුගමනය කරනු ලැබූ ක්‍රමවේදයන් තුනක් විය. එනම්.

I	ප්‍රශ්ණාවලියක් (Questionnaire)

II	සම්මුඛ පරික්ෂණ ක්‍රම (Interview Method)

III	නිරීක්ෂණය (Observation)

මෙහිදී වැදගත් වන්නේ වරදකරුවන් පිළිබඳ තොරතුරු ගවේෂණය කිරීමය. මෙවැනි අධ්‍යයනයකදී එම ක්‍රම වේදයන් තුන වඩාත් යෝග්‍ය බව පෙනී ගියේය. ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් සලකා බලන විට අපරාධකරුවන් සම්බන්ධව විශේෂ ආයතන වශයෙන් බන්ධනාගාර දෙපාර්තුමේන්තුව ද, බාලාපවාරීන් සඳහා රජයේ රැඳවුම් කඳවුරු ද. ඇතැම් පාසල් ද වැදගත් වේ.

මෙම පර්යේෂණ ක්‍රමවේදයන් තුළින් ශ්‍රී ලංකාවේ අපරාධවල ස්වභාවය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමටත්, හැකිතාක් සාධාරණය වන පරිදි නියැදියක් තෝරා ගැනීමටද උත්සුක වුණි.

මෙවැනි පර්යේෂණයක දී අපරාධකරුවන් සැමදෙනාම හමු වී තොරතුරු ලබා ගැනීම බෙහෙවින් කර්කශකය. එසේ හෙයින් අපරාධකරුවන් අතුරින් අවශ්‍යවන පරිදි සසම්භාවී (අහඹු) ලෙස නියැදියක් තෝරා ගැනීමට තීරණය කළෙමි. නියැදිය තෝරා ගැනීමේ දී සැලකිල්ල යොමු වූයේ රටේ සිටින සියලුම අපරාධකරුවන්ගේ සමාජ ක්‍රමය පිළිබඳ පර්යේෂණ කිරීමට අවකාශ නොමැති බැවිනි. අපරාධ යනු සමාජයේ ස්වාධීන වූ ද. හුදකලා වූ ද සිද්ධි මාලාවක් නොවේ. එය සමාජය වෙතින්ම ජනිත වූවකි. අපරාධ ප්‍රභවය ලබන මූලයන් සමස්ත සමාජය පුරා නිදන්ගතව පවතී.

ක්‍රමවේදයේදී ප්‍රශ්නාවලියට පිළිතුරු සැපයීමට පෙරාතුව එකිනෙකාගේ අතීතය පිළිබඳ තොරතුරු කියාපෑමට ඉඩ ප්‍රස්තාව ලබාදෙන ලදී. පර්යේෂණයේ දී පොදුවේ යොදා ගත් භාෂා මාධ්‍යය වූයේ සිංහලය. නියදියට හසුකරගත් වරදකරුවන් විවිධ ජාති-ආගම්වලට අයත් වූවන් විය. මෙම සියලු දෙනාටම සිංහල භාෂාව කථා කිරීමේ හා ලිවීමේ හැකියාව තිබුණි. කෙසේ වෙතත් නියදියට හසුකරගත් වරදකරුවන් ප්‍රශ්නාවලියට පිළිතුරු සැපයීමේදී ඒවායේ නිරවද්‍යතාව, සත්‍ය තොරතුරු හෙළිකිරීමට ඇති මැලිකම. පසුබැසීම සහ සත්‍ය තොරතුරු වසන් කිරීම යනාදිය ඔවුන් එකිනෙකාගේ පෞද්ගලික ආකල්ප මත යම් දුරකට සීමා විය හැකිය. එහෙයින් සමීක්ෂණයට ලක් වූ අපරාධකරුවන්ගේ සමාජ ආර්ථික තොරතුරු හා පවුල සම්බන්ධ තොරතුරු ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනු පරිශීලනය මගින් ලබාගත හැකි විය.

ක්‍රමවේදයේදී සම්මුඛ පරීක්ෂණය මගින් ලබාගත් තොරතුරු මත පමණක් පිහිටා සාර්ථක අධ්‍යයනයක් කිරීම තරමක් අපහසු කාර්යයකි. මෙම අඩුපාඩුව කිසියම් දුරකට හෝ වළක්වා ගනු වස් වැරදිකරුවන් හා සම්බන්ධ පුද්ගලයන්, දෙමාපියන්, අසල්වැසියන් ආදීන්ගෙන් තොරතුරු ලබාගැනීමට තීරණය කළෙමි. ඒ සමගම වැරදි කරුවන්ගේ පෞද්ගලික ලිපිගොනුවල ඇතුලත් සමාජ වාර්තාව මගින් එක් එක් වැරදි කරුවා පිළිබඳ චිත්‍රයක් මවාගත හැකි විය.

මෙහිලා සමස්ත සමාජ ක්‍රමය කෙරෙහි අවධානය යොමු කිරීම උකහට වන බැවින් මෙම අධ්‍යයනයේදී ලැබෙන පිළිතුර (නිගමනය) සාමාන්‍යකරණයක් විය හැකි බවද සඳහන් කළ යුතුය.

## (3) කල්පිතය (උපන්‍යාසය) (Hypothesis)

වර්තමාන සමාජයේ බෙහෙවින් වර්ධනය වෙමින් පවතින අපරාධ සම්බන්ධව බලපාන මූලික හේතු සමීක්ෂණය කිරීම මෙම පර්යේෂණ නිබන්ධයේ මුඛ්‍ය පරමාර්ථය වේ. එහිලා බුදුසමය තුළින් ප්‍රභාවිත ඉගැන්වීම් වෙසෙසින්ම වැදගත් කොටගෙන ඇත. අපරාධ කෙරෙහි බලපාන්නේ කුමන හේතූන් ද යන්න සලකා බැලීමේදී එක් සරළ හේතුවක් ඊට දැක්විය නොහැකි ය.

නූතන අපරාධවිද්‍යාව හා අපරාධ නීතිය බොහෝ රටවල දියුණු කරමින් පැවතුනත් තවමත් අපරාධවල වර්ධනයේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. එනයින් අපරාධ ඇතිවීමට හේතු සහ ඒවා වළක්වාලීමට දී ඇති ක්‍රම අපරාධවිද්‍යාව තුළින් හෝ අපරාධ නීතිය මගින් දැක්වුයේ වුවත්, එහි ප්‍රමාණාත්මක බවක් නොපෙනෙන බව ඊට හේතු විය හැකි ය. මෙහිලා වැදගත් කොටගන්නේ "දණ්ඩනවේදය" (Penology) පිළිබඳ සංකල්පයයි. දණ්ඩනය තුළින් අපරාධ වැළැක්විය හැකිද යන්න සොයා බැලිය යුතු කරුණකි. අපරාධවලට ගොදුරු වූ, ඇබ්බැහි වූ සෑම කෙනෙකුම දණ්ඩනය මගින් "පුනරුත්ථාපනය" (Rehabilitation) කළ හැකිද? අපරාධ කර සැඟවී සිටින්නන් (සැඟවුණ අපරාධ) ඒවා නැවත නැවත කරනු දැකිය හැකි ය. ඇතැම්හු ලජ්ජා-භය නිසා අපරාධවලට ගොදුරු වුවත් නිහඬව සිටිති. ඇතැම්හු අත්හළ නොහැකි අයුරින් අපරාධවලට ඇබ්බැහි වූවන් වෙති. මෙම කාණ්ඩ වලට වැටෙන අපරාධකරුවන් දඬුවම ක්‍රම මගින් පුනරුත්ථාපනය කළ හැකිද?

මානව විකාශනය තුළ දී පුද්ගල චර්යා රටා හැඩගැස්වීම කෙරෙහි සහජයෙන් ලද දෙයට වඩා පරිසරාත්මක සාධක බෙහෙවින් බලපෑම් කරන බව නූතන මනෝ විද්‍යාවෙන් පවා හෙළිදරව් වේ. පුද්ගල චර්යා හැඩගැස්වීම කෙරෙහි බලපාන පරිසරාත්මක සාධකවලට පුද්ගලයා ජීවත් වන පරිසරය, පවුල, පාසල, ආගමික ස්ථාන හා සමවයස් කණ්ඩායම්වල අන්තර් පුද්ගල සබඳතා වෙසෙසින් වැදගත් වේ.

බුදුසමය තුළ සිට එහි එන ඉගැන්වීම ඔස්සේ අපරාධවලට මූලික හේතු සොයා බැලිය හැකි ය. මෙම පර්යේෂණයේ පරමාර්ථය වන්නේ එයයි. අපරාධ කෙරෙහි බලපාන හේතු මොනවා ද? බුදුසමයේ එන ඉගැන්වීම්වලට අනුව මනෝවිද්‍යාත්මක සාධක මෙන්ම පාරිසරික සාධක ද අපරාධ කෙරෙහි බලපාන බවට උපන්‍යාසයක් (කල්පිතයක්) ගොඩනැගිය හැකි ය.